# උද්ධමනය පහළට

මහින්ද අලුත්ගෙදර

මේ වසරේ අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවේ පැවැති උද්ධමනය මැයි මාසය වන විට සියයට 5.2 දක්වා පහළ ගොස් තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර තිබෙන නවතම වාර්තාවක් මගින් පෙන්වා දෙයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, මේ වසරේ අප්‍රේල් මාසයේ පැවති සියයට 5.9 හි සිට මැයි මාසයේ දී සියයට 5.2 දක්වා තවදුරටත් පහළ ගොස් තිබෙන බවද එම වාර්තාව පවසයි.

2019 මැයි මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යාතමය බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන බව පෙන්වාදෙන මහ බැංකුව 2020 අප්‍රේල් මාසයේ දී සියයට 12.2හි පැවති ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 මැයි මාසයේ දී සියයට 11.1 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය ද, 2020 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 1.1හි සිට 2020 මැයි මාසයේ දී සියයට 0.8 දක්වා පහළ ගිය බවද කියාසිටී.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2020 අප්‍රේල් මාසයේ පැවති සියයට 5.1හි සිට 2020 මැයි මාසයේ දී සියයට 5.2 දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් තිබෙන අතර 2020 මැයි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.4ක් ලෙස වාර්තා වූ බවද ආහාර කාණ්ඩයේ අයිතමවල මිලගණන් ඉහළ යෑම මේ සඳහා බලපාන තිබේ.

ඒ අනුව, 2020 මැයි මාසයේ දී ආහාර කාණ්ඩයෙහි, ප්‍රධාන වශයෙන්, එළවළු, මාළු, පරිප්පු සහ පොල් තෙල් මිල ගණන්හි ඉහළ යෑමක් දක්නට ලැබෙන අතර මෙම මාසය තුළ දී ලොකු ළූණු සහ පොල් මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

මේ අතර, 2020 මැයි මාසයේ දී ආහාර නොවන කාණ්ඩයෙහි මද්‍යසාර පාන වර්ග හා දුම්කොළ (බුලත්) සහ විනෝදාත්මක හා සංස්කෘතික (පුවත්පත්) උප කාණ්ඩයන් හි අයිතමවල මිල පහළ ගියේය.

තවද, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 3.2 හි සිට 2020 මැයි මාසයේ දී සියයට 3.7 දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 අප්‍රේල් මාසයේ දී පැවති සියයට 5.0 හි සිට 2020 මැයි මාසයේ දී සියයට 4.8 දක්වා පහළ ගියේය.